**13 ශ්‍රේණිය ව්‍යාපාර සංඛ්‍යානය 6 වන සතිය - ජූනි 8 සිට 12 දක්වා**

**නිපුණතාව 10 - කළමනාකරණ තීරණ ගැනීමට සංඛ්‍යාන තත්ත්ව පාලන ශිල්පීය ක්‍රම භාවිත කරයි.**

**නිපුණතා මට්ටම 10.3 - උපලාක්ෂණික පාලනය සඳහා උචිත ක්‍රමවේද භාවිත කරයි.**

- නිෂ්පාදිතයක ඇතැම් ගුණත්ව ලක්ෂණ මිනීමට පහසු නොවේ.එවැනි උපලක්ෂණික හඳුනාගත හැක්කේ ඒවා භාණ්ඩයේ පැවතීම හෝ නොපැවතීම මතය.
- භාණ්ඩ ඒවායේ පිරිවිතරයන්ට අනුකූල නොවන විට සදොස් භාණ්ඩ ලෙසද අනුකූල වන විට නිදොස් භාණ්ඩ ලෙසද වර්ග කළ හැකියි.
- නිෂ්පාදිතයක ගුණත්ව තත්ත්ව යම් මිනුම් ඒකකයක් යොදා ගෙන මැනිය නොහැකි අවස්ථාවල ඒවායෙහි ගුණත්වය පාලනය කිරීම සඳහා උපලාක්ෂණික පාලනය යොදාගත හැකිය.
- උපලාක්ෂණික පාලනය සඳහා පහත පාලන සටහන් යොදා ගත හැකිය.

1.සමානුපාත පාලන සටහන (p සටහන)
2.සදොස් ඒකක සංඛ්‍යා පාලන සටහන ( np සටහන)
3. ඒකක සදොස් සංඛ්‍යා පාලන සටහන( C සටහන)
4.කොටස් ඒකක සදොස් සංඛ්‍යා පාලන සටහන(u සටහන)

- නියැදි දෝෂ සමානුපාත පාලනය කිරීම මගින් නිෂ්පාදිතයක ගුණත්වය පූර්ව නිශ්චිත මට්ටම තුළ පවතීද යන්න පරීක්ෂා කිරීම සමානුපාත පාලන සටහනක අරමුණයි.

**අභ්‍යාස**

- 30cm X60 cm ප්‍රමාණයේ යකඩ තහඩු නිෂ්පාදන ක්‍රියාවලියකින් නිමැවුන තහඩු 20ක් පරීක්ෂා කරන ලදී.එක් එක් තහඩුවෙහි නිරීක්ෂණය කරන ලද පලුදු සංඛ්‍යා පහත දැක්වේ.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 7 | 6 | 5 | 4 | 3 | 4 | 5 | 7 | 3 | 4 |
| 5 | 6 | 6 | 4 | 4 | 3 | 4 | 3 | 5 | 5 |

C සටහනක් නිර්මාණය කර තහඩුවක ඇති පලුදු ගණන පාලන තත්ත්වයේ පවතීද යන්න පෙන්වා දෙන්න.